**ජාතික සමාජ සංවර්ධන ආයතනය - 2023**

**----------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ජාතික සමාජ සංවර්ධන ආයතනයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අදාල තොරතුරු ද ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කල යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනයේ අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ආයතනයේ ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, **ආයතනයේ** වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ **ආයතනයේ** කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආයතනයේ ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සටහන් අංක 3.4 ප්‍රකාරව මුදල් අයකර පවත්වාගෙන යනු ලබන අදාළ පාඨමාලාවන් සම්පූර්ණ කර ඇති ප්‍රතිශතය පදනම් කරගෙන ආදායම හා වියදම හඳුනාගෙන ගිණුම්ගත කරන බව සඳහන් කර තිබුණද ඒ අනුව කටයුතු කර නොතිබුණි. ඒ අනුව රු. 32,514,729 ක් වූ පාඨමාලා ගාස්තු ආදායම හා රු. 34,387,050 ක් වූ පාඨමාලා වියදම් පිළිබඳ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 1 හි 27 වන පරිච්ඡේදය ප්‍රකාරව | ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති අංක 01 හි 24 වන පරිච්ඡේදය ප්‍රකාරව අවසාන ගිණුම් සහ අය වැය සමාන ක්‍රමයකට පිළියෙල කරන්නේ නම් අය වැය ඇස්තමේන්තු ව ද ඇතුළත් කර අවසාන ගිණුම් තීරු ක්‍රමයට පිළියෙල කිරීම සිදු කළ හැකිය. නමුත් අප ආයතනය විසින් උපචිත පදනම මත අවසාන ගිණුම් පිළියෙල කිරීම හේතුවෙන් වසර ගණනාවක සිට අය වැය තොරතුරු ඇතුලත් කිරීම සිදු කර නොමැති අතර භාණ්ඩාගාරයෙන් ලබා දෙන මුදල් වලින් කරන වියදම් සඳහා එක් අවසාන ගිණුමක් පමණක් පිළියෙල | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව කටයුතු කල යුතුය. |

| | | |
|---|---|---|
| සාධාරණ ලෙස ඉදිරිපත් කර නොතිබුණි. | කිරීම මෙතෙක් සිදු කර ඇත. ඉදිරියේදී භාණ්ඩාගාරයෙන් ලැබෙන මුදල් සඳහා හා එහි වියදම් සඳහා වෙනමම අවසාන ගිණුමක් උපචිත පදනමින් බැහැරව (මුදල් පදනමින්) පාලක සභා අනුමැතියකට යටත්ව පිළියෙල කිරීමට කටයුතු කරන බව. | |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය තුළදී තත්ත්ව සහතිකවීම් වැඩසටහන වෙනුවෙන් මිලදී ගෙන තිබූ රු. 607,600 ක් වූ ලැප්ටොප් පරිගණකය, දේපල පිරියත හා උපකරණ යටතේ ගිණුම් ගත කල යුතු වුවත්, වර්ෂයේ තත්ත්ව සහතිකවීම ( Quality Assurance ) වියදම් ලෙස ගිණුම්ගත කිරීමෙන් සමාලෝචිත වර්ෂයේ වියදම එම ප්‍රමාණයෙන් වැඩියෙන් හා වත්කම් වටිනාකම අඩුවෙන් දක්වා තිබුණි. | මෙම ලැප්ටොප් පරිගණක දෙක මිල දී ගෙන ඇත්තේ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 29 වන දිනය. තත්ත්ව සහතිකවීමේ අය වැය වාර්තාවේ මේ සඳහා ප්‍රතිපාදන වෙන් කර පාලක සභාව මඟින් අනුමැතිය ලබා ගෙන ඇති බැවින් අදාළ වියදම තත්ත්ව සහතික වීමේ මධ්‍යස්ථානය (Center of Quality Assurance) යටතේ දක්වා ඇත. 2024 වර්ෂයේ දී මෙය වත්කමක් ලෙස දේපළ පිරියත හා උපකරණ යටතේ ගිණුම් ගත කර විගණිත දින සිට ක්ෂය කපා හැරීමට අදාළ පියවර ගන්නා බව. | වත්කම් නිවැරදිව ගිණුම් ගත කල යුතුය. |
| (ආ) | පාඨමාලා ආදායමෙන් සියයට 20 ක් ජාතික සමාජ සංවර්ධන අරමුදලට බැර කිරීමට තීරණය කර තිබුණද එම ප්‍රමාණයට වඩා වැඩියෙන් හා අඩුවෙන් මුදල් බැර කර තිබූ අවස්ථා නිරීක්ෂණය වූ අතරම වර්ෂය තුල ආරම්භ කර තිබූ ආදායම රු. 22,752,082 ක් වූ පාඨමාලා 12 කින් කිසිදු මුදලක් අරමුදලට බැරකර නොතිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ අරමුදලට බැරකර තිබූ රු. 8,012,324 ක මුදල නිවැරදි නොවන බව නිරීක්ෂණය විය. | සමාලෝචිත වර්ෂයේ දී අරමුදලට බැර කර ඇත්තේ රු. 8,012,324/- ක මුදලක් පමණි. ඉතිරි පාඨමාලා සඳහා අදාළ මුදල පළමු සෙමෙස්තර විභාගයෙන් අනතුරුව පාඨමාලා වලට අදාළ අය වැය ඇස්තමේන්තු සංශෝධනය කිරීමෙන් අනතුරුව සකස් කරන ලද පාඨමාලා ඇස්තමේන්තු මඟින් අරමුදලට ලබාදේ. ආයතනය මඟින් පවත්වා ගනු ලබන පාඨමාලා මෙහෙය වනු ලබන්නේ සමාජ සේවා විද්‍යාලයෙන් හා පුහුණු අංශයෙනි. එක් එක් පාඨමාලා වලට අදාල ආයතනික ගාස්තු වවුචර් පත් මෙම අංශ දෙක හරහා ගිණුම් අංශයට ලැබුණු පසු අරමුදලට එම මුදල් බැර කිරීම සිදු කරයි. ඒ අනුව වවුචර් පත් ලැබෙන පරිදි සමාලෝචිත වර්ෂයේ දී නියමිත පරිදි වවුචර්පත් ලබා දෙන ලෙස අදාළ අංශ දැනුවත් කළ බව. | නිවැරදිව ගිණුම් ගත කිරීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | වාර්ෂිකව සමාජ වැඩ උපාධි පාඨමාලාව සඳහා මහපොළ ශිෂ්‍යත්වලාභින් වෙනුවෙන් රජයෙන් ලැබිය යුතු මුදල හා වාර්ෂිකව සිසුන්ට ගෙවිය යුතු මුදල උපචිත පදනම මත ගිණුම් ගත නොවීම හේතුවෙන් පසුගිය වර්ෂයේදි ශිෂ්‍යත්වලාභින් ට ගෙවිය යුතු රු.1,203,800 ක් හා සමාලෝචිත වර්ෂයේ ගෙවිය යුතු රු. 384,850 ක මුදලක් අදාල වර්ෂයේ ආදායම ලෙස ගිණුම්ගත කර තිබුණි. | සමාජ වැඩ උපාධි පාඨමාලාව සඳහා රජයෙන් ලැබී ඇති මහපොළ ශිෂ්‍යත්ව මුදල් පිළිවෙලින් පසුගිය වර්ෂයේ 1,203,800/- ක් හා සමාලෝචිත වර්ෂයේ 384,850/- ක් වන අතර ඉන් පසුගිය වර්ෂයේ දී රු. 963,200/- ක් හා සමාලෝචිත වර්ෂයේ දී රු. 356,900/- ක මුදලක් ශිෂ්‍යත්ව ලාභීන් අතර බෙදා දී ඇත. ඉතිරි මුදල උපචිත ලෙස ගිණුම් ගත කර නිවැරදි කිරීමට හා මහපොළ භාර අරමුදලට යැවීමට කටයුතු කළ බව. | නිවැරදිව ගිණුම් ගත කල යුතුය. |
| (ඈ) | වාහන හා යන්ත්‍රෝපකරණ අලුත්වැඩියා සඳහා දරන ලද රු. 2,387,043 ක පුනරාවර්තන වියදම, ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගත කර තිබීමෙන් ස්ථාවර වත්කම් වටිනාකම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණු අතර වියදම් අඩුවෙන් දක්වා තිබුණි. | ස්ථාවර වත්කම් අලුත්වැඩියාව සඳහා දීර්ඝ කාලීනව භාණ්ඩාගාරයෙන් ලබා දෙන පුනරුත්ථාපන ප්‍රතිපාදන වලින් දරණ වියදම 2016 වර්ෂයේ සිට 2021 දක්වා ස්ථාවර වත්කම් සටහන මඟින් (Rehabilitation) පෙන්වා ඇත. (LKAS 16 අනුව) පසුගිය වර්ෂයේ දී ප්‍රාග්ධන වියදම් ලබා දී නොමැති බව. | නිවැරදිව ගිණුම් ගත කල යුතුය. |
| (ඉ) | වටිනාකම රු. 15,795,278 ක් වූ පරිගණක හා උපාංග යන්ත්‍රෝපකරණ යටතේ ගිණුම්ගත කර තිබුණි. | පෙර වර්ෂ වලදී ද පරිගණක උපාංග ගිණුම්ගත කර ඇත්තේ යන්ත්‍රෝපකරණ හා උපාංග යටතේ වන අතර පරිගණක උපාංග සඳහා වෙනම ගිණුමක් පවත්වා ගෙන නොමැත. විගණනයෙන් දක්වා ඇති පරිදි 2024 වර්ෂයේ දී පරිගණක හා උපාංග සඳහා වෙනම ගිණුමක් පවත්වා ගැනීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම් ගත කල යුතුය. |
| (ඊ) | සමාලෝචිත වර්ෂයේ ශිෂ්‍යාධාර වියදම තුළ අධ්‍යාපන චාරිකාව වෙනුවෙන් දරන ලද රු. 326,000 ක් ද ගිණුම් ගත කර තිබුණි. ඒ අනුව වර්ෂයේ ශිෂ්‍යාධාර වියදම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි | මෙම වියදම් දෙවර්ගයම සමාජ වැඩ පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධි පාඨමාලාව වෙනුවෙන් දරණ ලද වියදම් බැවින් BSW-Bursary ලෙස මූල්‍ය ප්‍රකාශනයේ එක් වියදමක් ලෙස දක්වා ඇත. රු. 326,000/- ක අධ්‍යාපන චාරිකාව වෙනුවෙන් දරණ ලද වියදම හා ශිෂ්‍යාධාර වියදම එකතුවක් ලෙස දැක්වෙන බව. | ගනුදෙනු නිවැරදිව ගිණුම් ගත කල යුතුය |

### 1.5.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂය | මුදල | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| ස්ථාවර වත්කම් | රු. 30,077,526 | ස්ථාවර වත්කම් ලේඛනය හා උපලේඛනයේ සඳහන් 2014 හා 2016 යන වර්ෂයන්හි සිට පැවත එන රු. 13,181,463 ක් වූ කාර්යාල උපකරණ හා රු. 9,652,434 ක්වූ යන්ත්‍රෝපකරණ රු. 7,243,629 ක් වූ පුස්තකාල පොත් ඇතුළු රු. 30,077,526 ක් වූ ස්ථාවර වත්කම් වල ආරම්භක ශේෂ තහවුරු කර ගැනීම සඳහා එම වත්කම් ගත් දිනය,පිරිවැය, වත්කමේ ස්වභාවය ඇතුළු කිසිදු තොරතුරුක් විගණනයට ඉදිරිපත් නොවීය. | ස්ථාවර වත්කම් ලේඛණයේ 2016 වර්ෂය සඳහා දක්වා ඇති ආරම්භක ශේෂ ලබා ගෙන ඇත්තේ පෙර වර්ෂ වල මූල්‍ය ප්‍රකාශන මඟින් වන නමුත් ඊට පෙර ආයතනයේ ස්ථාවර වත්කම් ලේඛණයක් පවත්වා ගෙන ගොස් නොතිබුණු අතර එම ආරම්භක ශේෂයන්ට අයත් ස්ථාවර වත්කම් පිළිබඳ වෙන් වෙන් වශයෙන් භාණ්ඩ හෝ වටිනාකම හඳුනා ගෙන නොතිබුණි. 2016 ජනවාරි 01 දිනට පැවති මුළු ශේෂය ආරම්භක ශේෂය වශයෙන් සැලකිල්ලට ගෙන එතැන් සිට ස්ථාවර වත්කම් ලේඛණය නිවැරදිව පවත්වා ගෙන ඇති බව. | මූල්‍ය ප්‍රකාශන වල දක්වන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කල යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.12,241,680 අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.21,762,788 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.9,521,108 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට වියදම් වල වර්ධනය ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අවශ්‍යතාවය නිසි පරිදි හඳුනානොගෙන රු. 280,125 කට 2021 ඔක්තෝබර් 05 දින මිලදී ගෙන තිබූ ආලින්ද පුටු (Lobby chairs) 24 ක් වසර 2 ක් ගත වී තිබුණද නිශ්කාර්යව ගබඩාවේ රඳවා තිබුණ අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 30 දින මිලට ගෙන තිබූ රු. 39,296,925 ක ගෘහ භාණ්ඩ තොගයක් වාර්තාවේ දින දක්වා භාවිතයට නොගෙන පැවතුණි. අක්‍රීය වීම හේතුවෙන් අළුත්වැඩියා කිරිමට ගබඩාවට භාර දී තිබූ පරිගණක 12 ක් වසරකටත් වඩා වැඩි කාලයක් අලුත්වැඩියා නොකොට ගබඩාවේ නිශ්කාර්යව රඳවා තිබුණි. | 2021 වර්ෂයට ගොඩනැගිල්ල සඳහා භාණ්ඩ මිලදී ගැනීමට වෙන්කරන ලද මුදල් වලින් Wing A හා Wing B සඳහා ආලින්ද පුටු (Lobby Chairs) මිලදි ගන්නා ලදී. මින් යම් ප්‍රමාණයක් Wing B දැනට පංතිකාමර පවත්වන අධ්‍යයන ගොඩනැගිල්ලේ භාවිතා කරමින් පවතී. Wing A පරිපාලන ගොඩනැගිල්ලේ අදාල ස්ථාන වල මෙම ආලින්ද පුටු (Lobby Chairs) වලින් වැඩි ප්‍රමාණයක් ස්ථාපිත කලයුතුව ඇත. ගොඩනැගිල්ලේ ඉදිකිරීම් මූලික එකගතාවය මත 2020 අප්‍රේල් 03 දිනට අවසන් කිරීමට නියමිතව තිබුණද රට තුල පැවති Covid 19 හේතුවෙන්, පැන නැගී ඇති අනෙකුත් මූලික ගැටලු හේතුවෙන් නියමිත දිනයට අවසන් කිරීමට නොහැකි වූ බව. | අවශ්‍යයතාවය හඳුනාගෙන උපරිම ඵලතායිතාවයක් ලැබෙන ආකාරයට අරමුදල් යෙදවීම සිදුකර යුතු අතර අදාළ කාර්යයන්ට කඩිනමින් උපකරණ යොදා ගත යුතුය. |
| (ආ) | 1992 අංක 41 දරන ජාතික සමාජ සංවර්ධන පනතේ 2 වන වගන්තිය ප්‍රකාරව පිහිටුවා ඇති ජාතික සමාජ සංවර්ධන අරමුදල සඳහා ආයතනය විසින් මුදල් අය කර පවත්වා ගෙන යනු ලබන පාඨමාලාවලින් සියයට 20 ක් අරමුදලට වාර්ෂිකව එකතුවේ. වර්ෂයේ ගිණුම්ගත කර තිබූ රු. 8,012,324 ක මුදල 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 හි 11 කොටසේ 7 වන පරිච්ඡේදයේ 7.1.4 ඡේදය ප්‍රකාරව ආයතනයේ යටිතල පහසුකම් සංවර්ධන කටයුතු සඳහා යෙදවිය හැකිව තිබුණත් එම මුදලින් රු. 3,452,202 ක් එනම් සියයට 43 ක් පමණක් ඩිජිටල්කරණ වැඩසටහනකට සහ තත්ත්ව සහතික වීමේ වැඩසටහන වෙනුවෙන් වැය කර තිබුණි. 2021 හා පසුගිය වර්ෂයන්හි දී පිළිවෙලින් පාඨමාලා ආදායමෙන් රු. 3,767,251 ක් හා | ආයතනයේ අරමුදලින් 2023 දෙසැම්බර් 31 වන විට ඉතිරිව ඇති රුපියල් 13,622,201/- ක මුදලින් වියදම් දැරීම සඳහා 2024 ක්‍රියාකාරී සැලැස්ම මගින් තත්ත්වසහතිකකරණය, ඩිජිටල්කරණය හා ජාලගතකරණය සඳහා රුපියල් මිලියන 17.528 ක ප්‍රතිපාදන වෙන්කර ඇත. මෙම වියදම් ආයතන අරමුදලේ ඉතිරිව ඇති මුදලට අමතරව 2021 වර්ෂයේ දී පාලක සභා උපදෙස් මත පාඨමාලාවල අතිරික්ත ආදායමෙන් ස්ථාවර තැම්පතු ලෙස ආරම්භකර ඇති රු. මිලියන 25 ක මුදලින්ද වියදම් දැරීමට නියමිත බව. | පනත් හා චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | රු. 465,529 ක් අරමුදලට මාරු කර තිබුණද ආයතනයේ යටිතල පහසුකම් සංවර්ධන කටයුතු වෙනුවෙන් මුදල් වැය කර නොතිබුණි. මේ නිසා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31දිනට අරමුදල් ශේෂය රු.13,622,201 ක් දක්වා වර්ධනය වී ඌණ උපයෝජිතව පැවතුණි. | | |
| (ඇ) | ආයතනයට අයත් තක්සේරු වටිනාකම රු. 10,600,000 ක් වූ කැළණිය සිසු නේවාසිකාගාරය 2020 ජුනි මාසයේ සිට භාවිත කරමින් තිබූ භාණ්ඩ ද සමඟ වාර්තාවේ දිනය දක්වා නිශ්කාර්යව පැවතුණි. මෙම නේවාසිකාගාරය භාවිතයෙන් තොරව පැවති කාලය වසර 03 ක් ඉක්මවා තිබුණු අතර එය නිසි නඩත්තු කිරීමක් සිදු කර නොමැති බැවින් නේවාසිකාගාරය විනාශ වෙමින් පැවතුණද කළමනාකරණය විසින් මෙම දේපල පිළිබඳව කඩිනමින් සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීමට කටයුතු කර නොතිබුණි. | 2020 වසරේ ආයතනය රාජගිරියේ සිට සීදුවට රැගෙන යාමත් සමග සිසුන් කැලණියේ නේවාසිකාගාරයෙන් ඉවත් වී සීදුව අවට පදිංචි විය. නේවාසිකාගාරයේ නඩත්තු කටයුතු සඳහා ද විශාල වියදමක් දැරීමට සිදුවු අතර පාලක සභා උපදෙස් පරිදි කැලණිය විශ්ව විද්‍යාලයේ සිසුන් වෙත ලබාදීමට එහි පාලන අංශය වෙත දැනුම් දුන් අතර විදේශීය සිසුන් සඳහා නේවාසිකවීම් වෙනුවෙන් ලබාගැනීමට ඇති හැකියාව සලකා බලන බව පාලන අංශයෙන් දැනුම් දී ඇත. නමුත් මේ පිළිබදව විමසීම් සිදුකළද යහපත් ප්‍රතිචාර නොලැබුණි. 2024 අප්‍රේල් මස පැවති ආයතනයේ පාලක සභාව විසින් දැනුම් දෙන ලද්දේ නේවාසිකාගාරය වෙනත් ආයතනයකට බදු පදනම යටතේ ලබාදීමට කටයුතු කරන ලෙසයි. කැලණිය නේවාසිකාගාරයේ තිබූ භාණ්ඩ වලින් කොටසක් මේ වන විට ප්‍රධාන කාර්යාලයේ ප්‍රයෝජනය සඳහා යොදාගෙන ඇති බව. | අදාල වත්කම කඩිනමින් ඵලදායි කාර්යයක් සඳහා යොදාගත යුතුය. |